
# අපේ වත්තට සත්තු ඇවිත්



තවීසා චන්තුලි හේරත්

# අපේ වත්තට සත්තු ඇවිත්

තවීසා චන්තුලි හේරත්

අපේ වත්තට සත්තු ඇවිත්

---

©තවීසා චන්තුලි හේරත්
මහාමායා බාලිකා විදුහල
2 ශ්‍රේණිය A
2023-12-14

පිදුම

*මගේ ලෝකේ වීරයා.....*

*මගේ ආදරණීය අප්පච්චිට.....*

## ස්තූතිය

මා හට අකුරු ඉගැන්වූ ගුරුවරුන්ටද, හැමදාමත් ආදරයෙන් මා හට උදව් කරන මගේ අප්පච්චිටද, අම්මාටද ස්තූතියි.

තවීසා චන්තුලි හේරත්,
2 ශ්‍රේණිය A,
මහාමායා බාලිකා විදුහල,
මහනුවර.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-10-20

අද අපට ස්කෝලේ නිවාඩු. ඒත් උදෙන්ම නැගිටලා මම අත්තම්මත් එක්ක ඈත අහස දිහා බලාගෙන හිටියා..... කන්ද උඩින් ඉර පායලා හරිම ලස්සනයි..... හැමදාම වගේ අදත් උදෙන්ම කොක්කු රෑන ඈත අහසේ පියාඹලා යනවා..... හරියට සුදු රෙද්දක් එළලා වගේ... අත්තම්මා නම් කියන්නේ එයාලා වික්ටෝරියා ජලාශෙට කෑම හොයාගෙන යනවා කියලා...



වලාකුළු පුළුන් පොදි වගේ ඈතට යනවා..... මම බලාගෙන හිටියේ හරිම ආසාවෙන්...

ඒවා එක එක එකතු වෙලා ලස්සන රටා මවනවා..... හරිම ලස්සනයි.....

කොච්චර බලාගෙන හිටියත් ඇති වෙන්නේ නෑ.....



''අන්න අත්තම්මේ ලොකු කුරුල්ලෙක් අහසේ රවුමට රවුමට පියාඹනවා.''

මම එහෙම කියනකොට අත්තම්මා කීවා එයා උකුස්සෙක් කියලා.

තටු දෙක ඈතට විහිදගෙන හරිම වේගෙන් රවුමට පියාඹන්නේ..... එයා කොයිතරම් වේගෙන් ගියත් එයාගේ බැල්ම පහතට හරවගෙනයි හිටියේ.....

අත්තම්මා කියනවා එයා වැවේ මාළුවෙක්ට කුරුමානම් අල්ලනවාළු.



දැන්නම් හොඳටම උදේ වෙලා..... ඉරත් ලස්සනට පායලා..... මිදුලේ තියෙන සමන්පිච්ච වැලේ මල් පිපිලා හරිම සුවඳයි... සමනල්ලු රංචුවක් වටේට කැරකෙනවා හරිම ලස්සනයි. මට හිතෙනවා එයාලා මල් එක්ක කතා කරනවා කියලා...



ඈතින් මුණු මුණු ශබ්දයක් ඇහුණා... අම්මෝ මම හොඳටම බය වුණා.... එක පොදියට යන මී මැස්සො රංචුවක්..... හරිම එකමුතුකමින් එකම පොකුරට පියාඹනවා....

එයාලා සංචාරක මී මැස්සො අත්තම්මා කිව්වා... එයාල ඈතට පියාඹගෙන යන කල් මම බලාගෙන හිටියා...

පරිසරය දිහා බලාගෙන ඉන්නකොට අපට මොනතරම් දේවල් පේනවද? අද මට හරිම සතුටුයි.... ගස්වැල්, සත්තු මගෙත් එක්ක කතා කරනවා වගේ මට දැනෙනවා.... ඔන්න අපේ ගෙදරට හැමදාම එන අමුත්තො ටික අදත් ඇවිල්ලා....




ඒ තමයි රිලා පැංචෝ ටික.... එක රිලා අම්මා කෙනෙක් බඩේ පැටව් දෙන්නෙක්ම බැඳගෙන ඉන්නවා....

එයාලා හරිම ආදරෙන් අම්මත් එක්ක ඉන්නේ.....

එයාලා අම්මගෙන් පොඩ්ඩක් හරි ඈත් වුණොත් වලිගෙන් ඇදලා ආපහු ළඟට ගන්නවා. අම්මා එයාට සැරකරනවා දඟ කරන්න එපා කියලා....

අනේ.... ඒ චූටි පැටව් දිහා කොච්චර බලාගෙන හිටියත් ඇති වෙන්නේ නම් නෑ.... හරිම ලස්සනයි...



ඔන්න එතකොටම මයිනො රංචුවක් ඇවිල්ලා කිචි බිචි ගගා මිදුලෙ මොනවදෝ හොයනවා....

පුංචි ගැඩවිල් පණුවො හොයනවා වගෙයි...



අර බලන්න අත්තම්මේ....

මිදුලෙ තියෙන අලිපේර ගහේ කෙඳි කෙඳි ගොඩක් තියෙනවා.....

අම්මෝ...... දළඹුවෝ ගොඩක්...... එකම තැනක ගුලි වෙලා.....

මට බය හිතුණා. සමනල්ලු වෙන්න කලින් කෝෂ හදන්න එක තැන ඉන්න දළඹුවෝ ලූ......



එක දවසක් උදේ අපේ මිදුලට ඉබ්බෙක් ආවා.... එයා පුංචි පැටියෙක්......

එයා හොඳටම බය වෙලා හිටියේ....

අපි එයාව තණකොළ ගොඩෙන් තිබ්බා..... ටික වෙලාවකින් බලනකොට එයා එතන හිටියේ නැ....



ගස්වල මල් පිපී නටයි

සුදු පාටින් කොක්කු රෑන දුර අහසේ පියඹා යයි

රිලා අම්මා පැටියා වඩන් මිදුල වටේ දුව පැන යයි

සමනලයින් රංචු ඇවිත් අපේ මිදුල හරිම හැඩයි





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023-10-20